99

# බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ සහ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.

1. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව :- පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප)
යොමු අංකය :- එල්ජීඩී/02/21/03/100
දිනය :- 2014.03.20

1.2 අමාත්‍යාංශය :- පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)
යොමු අංකය :- CM/WP/E15/5/1-1
දිනය :- 2014/03/27

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :- යොමු අංකය :- ඩී.එම්.එස්/ඩී/පොදු/11-2
දිනය :- 2012.12.19

1.4 ප්‍රධාන ලේකම්(බ.ප) නිර්දේශය :- යොමු අංකය :- CSO/PTR/15/3/5
දිනය :- 2014-04-24

1.5 වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :- යොමු අංකය :-
දිනය :-

1.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- යොමු අංකය :- 1/4/2/5/100
දිනය :- 2014.07.03

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :- යොමු අංකය :-
දිනය :-

2 පත් කිරීම් බලධාරියා :- මහා නගර සභාවක නාගරික කොමසාරිස් වන අතර නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක ලේකම් වේ.

ක්‍රියාත්මක වන දිනය :- ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

3 සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය :- කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2.

3.2 ශ්‍රේණි :- III, II, I ශ්‍රේණි වලින් සමන්විතයි.

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :- ආයතනයන්හී විධායක කළමනාකරණ හා පරිපාලන කාර්යයන්හී නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නා වූද, ඒකළ ස්වරූපයේ වූද (Single Functional) කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් විශේෂයෙන් නියම කොට දක්වන ලද කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4 කාර්යයන් පැවරීම :- ශ්‍රේණිගතව කාර්යයන් පැවරීම සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත යෝග්‍යතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට මහා නගර සභාවක නාගරික කොමසාරිස් විසින්, නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක ලේකම් විසින් පවරනු ලැබිය හැක.

අනුමත කරමි / කොපරමි.
දිනය 2014.07.08

98

තනතුරෙහි/තනතුරුවල ස්වභාවය :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

5 වැටුප්

5.1 වැටුප් කේත අංකය :- MN 1 – 2006A

5.2 වැටුප් පරිමාණය :- රු.13120-10x 145-11x170-10x240-10x320-22040

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :-

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය(රු.) |
|---|---|---|
| III | ආරම්භක පියවර | 13,120/- |
| II | පියවර 12 | 14,740/- |
| I | පියවර 23 | 16,680/- |

6 සේවා ගණයට අයත් තනතුර/තනතුරු :-

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු | III,II,I, ශ්‍රේණි | 04 | පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සැලසෙන පරිදි ක්‍රමානුකූලව කසළ අපහරණය කිරීම, එක්රැස් කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම, ඒ සම්බන්ධව සැලසුම් කිරීම, ක්‍රමෝපායන්හි යෙදීම හා නීතිමය තත්ත්වයන් යටතේ ක්‍රියා කිරීමට දායක වීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- 04 කි. මෙය කලින් කල වෙනස් වීමට ඉඩ ඇත.

(ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර අනුමත ආයතන හා තනතුරු සංඛ්‍යාව - ඇමුණුම 01)

7 බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100% |
| කුසලතා | - |

සටහන :- සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවලදී විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය.

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

97

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

7.2.2.2 වෘත්තිය සුදුසුකම් :- අදාළ නැත.

7.2.2.3 පළපුරුද්ද :- අදාළ නැත.

7.2.2.4 කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව :- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතුය.

7.2.3.2 උපරිම සීමාව :- අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.2.4.1 ලිඛිත විභාගය :- අදාළ නැත.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.2.4.1.1 පවත්වන බලධරයා :-

7.2.4.2 වෘත්තිය පරීක්ෂණය :- අදාළ නැත.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.2.4.2.1 පවත්වන බලධරයා :-

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :- අදාළ නැත.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :-

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ක්ෂේත්‍රයට අදාළ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම (ප්‍රශ්න කිහිපයකට වාචිකව පිළිතුරු ලබා දීම.) | 20 | 50% |
| කසළ කළමනාකරණය පිළිබඳ ලබා ඇති පුහුණු පාඨමාලා සඳහා සහභාගී වී තිබීම. (සහතිකයකට ලකුණු 05 බැගින්) | 25 | |
| පෞරුෂත්වය | 05 | |

සටහන - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහිදී සලකා බැලේ.

1/1/4/262 2014.07.08

(96)



7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- අදාළ පත්වීම් බලධරයා.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම පළකිරීම හෝ පුවත්පත් දැන්වීම පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය.

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.)

7.3.2.2 වෘත්තීය සුදුසුකම් :- අදාළ නැත.

7.3.2.3 පළපුරුද්ද :- පළාත් පාලන ආයතනයක ප්‍රාථමික තනතුරුවල සේවය කරන්නන්ට මේ සඳහා අයදුම් කළ හැකි වන අතර, තනතුරේ ස්ථිර කර තිබිය යුතුය. ඉල්ලුම් කරන දිනට වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර එම කාලය තුළ කිසිදු විනය දඬුවමකට ලක් වූ අයෙකු නොවිය යුතුය.සේවා කාලය ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් තහවුරු කළ යුතුය.

7.3.2.4 කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

7.3.3 වයස

7.3.3.1 අවම සීමාව :-
7.3.3.2 උපරිම සීමාව :-

} දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට වයස් සීමාවන් අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.3.4.1 ලිඛිත විභාගය :- අදාළ නැත.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.3.4.1.1 පවත්වන බලධරයා :-



1/1/4/262 2014.02.08

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නැත.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.3.4.2.1 පවත්වන බලධරයා :-

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- අදාළ නැත.

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ :-

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :-

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්. (අ.පො.ස.(උ/පෙළ) | 10 | 50% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | 20 | |
| අමතර සේවා කාලය. | 15 | |
| පෞරුෂත්වය | 05 | |

සටහන :- සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාවයන්ද මෙහිදී සලකා බැලේ.

( ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුරට බඳවා ගැනීම (සීමිත) සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ විෂය නිර්දේශය - ඇමුණුම අංක 03.)

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- අදාළ පත්වීම් බලධරයා.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- ගැසට් පත්‍රයේ හෝ පුවත්පත් දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම :- අදාළ නැත.

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය :-

7.4.2 සුදුසුකම් :-

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් :-

7.4.2.2 වෘත්තීය සුදුසුකම් :-

7.4.2.3 පළපුරුද්ද :-

7.4.2.4 කායික සුදුසුකම් :-

7.4.2.5 වෙනත් :-

7.4.3 වයස :-

7.4.3.1 අවම සීමාව :-

7.4.3.2 උපරිම සීමාව :-

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය :-

1/1/4/262 2014.07.08

7.4.4.1 ලිඛිත විභාගය :-

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.4.4.1.1 පවත්වන බලධරයා :-

7.4.4.2 වෘත්තීය පරීක්ෂණය :-

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.4.4.2.1 පවත්වන බලධරයා

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- අදාළ නැත.
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ

7.4.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා

7.4.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නැත.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.4.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :-

## 8 කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. (ඇමුණුම - 04) | ලිඛිත බහුවරණ |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස්වී වසර 03ක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. (ඇමුණුම - 05) | ලිඛිත |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස්වී වසර 05ක් ගත වීමට පෙර තෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. (ඇමුණුම - 06) | ලිඛිත |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද? :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද? :-

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම
} අදාළ පත්වීම් බලධරයා.

1/14/262 2014.02.08

9 භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච.01/2014 චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව (අදාළ වන්නේ නම් පමණි) | අදාළ නැත. |

10 ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම.

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට නියමිත සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, සේවයේ වසර දහය(10) සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම.

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

II. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) තුළම සතුටුදායක හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

[illegible] අනුමත කරන ලදී.
[illegible] 1/1/4/262 2014.07.08

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා, පත්කිරීම් බලධරයා වෙත, අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සේවයේ වසර දහය (10) සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3 1 වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම :- අදාළ නැත.

10.3.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව
10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-
10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය :- ,

11 තනතුරු වලට පත් කිරීම :- අදාළ නැත.

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය |
|---|---|---|
| | | |
| | | |

(අවශ්‍ය වේ නම් ඇමුණුමක් භාවිතා කරන්න)

12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලටද, අමාත්‍යංශය හා දෙපාර්තමේන්තු නියෝගවලටද අනුව කටයුතු කළ යුතුය.

13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :-

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වේනොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :- අදාළ නැත.

15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

1/1/4/262 2014.07.08

(91)

<u>අර්ථ නිරූපණ</u>

➢ <u>සතුටුදායක සේවා කාලය :-</u>

'සතුටුදායක සේවා කාලය' යනු රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද එම කාලය තුළදී උපයා ගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ නිලධාරියා විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය. (අවවාද කිරීම්/ තදින් අවවාද කිරීම් හැර)

➢ <u>සක්‍රීය සේවා කාලය :-</u>

'සක්‍රීය සේවා කාලය' යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

➢ <u>නියමිත දිනට :-</u>

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය 'නියමිත දිනය' ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධරයින්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධරයින්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

සකස් කළේ : [signature]
නම : ඒ. කේ. පී. එම්. මෛත්‍රීරත්න
තනතුර : පරිපාලන නිලධාරී
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)
දිනය : 14.03.19

පරීක්ෂා කළේ : [signature]
නම : එච්. ඒ. එස්. සෙව්වන්දි
ශ්‍රී. ලං. ප. සේ. III
තනතුර : සහකාර පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)
දිනය : කොළඹ-07

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත
දිනය : 03/20

---

යොමු අංකය : CM/WP/E/5/5/1-1

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : [signature]
අමාත්‍යාංශ ලේකම් (බ.ප)

දිනය : 2014/3/31

නිල මුද්‍රාව: එස්.ඩී. කොඩිකාර
ලේකම්
[illegible]



1/1/4/262 2014.07.28

(90)

යොමු අංකය : CSO/PTR/15/3/5

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..................

ප්‍රධාන ලේකම් (බ.ප)

දිනය : 2014-04-24

නිල මුද්‍රාව: ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

---

යොමු අංකය : 1/4/2/5/100

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..................

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)

දිනය : 2014.07.03

නිල මුද්‍රාව: සී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

---

යොමු අංකය: ..................

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය 2014.7.8 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

අත්සන : ..................

ආණ්ඩුකාර ලේකම්.

දිනය : 2014.7.8

නිල මුද්‍රාව: සුනිල් අබේවර්ධන,
~~බ.ප. ආණ්ඩුකාර ලේකම්~~
බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
98/4, හැව්ලොක් පාර,
කොළඹ 05.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/1/4/262
2014.07.08

ඇමුණුම 01

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර අනුමත ආයතන හා තනතුරු සංඛ්‍යාව.

| අනු අංකය | පළාත් පාලන ආයතනය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | කැස්බෑව නගර සභාව | 01 |
| 2. | ජා ඇල නගර සභාව | 01 |
| 3. | කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව | 01 |
| 4. | අගලවත්ත ප්‍රාදේශීය සභාව | 01 |
| | එකතුව | 04 |

ගරු [illegible] විසින් සභාගත කරන ලදී.
ලේඛන අංකය 1/1/4/262 දිනය 2014.07.08

(৪৪)

ඇමුණුම 02.

## සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු III ශ්‍රේණියේ තනතුරට (විවෘත) බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නම :- සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු III ශ්‍රේණියේ තනතුරට (විවෘත) බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :-

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|
| ක්ෂේත්‍රයට අදාළ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම (ප්‍රශ්න කිහිපයකට වාචිකව පිළිතුරු ලබා දීම) | 20 | 50% |
| කසළ කළමනාකරණය පිළිබඳ ලබා ඇති පුහුණු පාඨමාලා සඳහා සහභාගි වී තිබීම (සහතිකයකට ලකුණු 05 බැගින්) | 25 | |
| පෞරුෂත්වය (නිලධාරියා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |

3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්වීම් බලධරයා.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව සලකා බැලීමෙන් පසුව.

අත්සන : H—ɜ
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : ... පළාත
03 | 20

සහතික කළ පිටපත ... 
... 1/1/4/262 ... 2014.02.08

87

ඇමුණුම 03.

<u>සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු III ශ්‍රේණියේ තනතුරට</u>
<u>(සීමිත) බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය</u>

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නම :- සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු III ශ්‍රේණියේ තනතුරට (සීමිත) බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :-

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්. (අ.පො.ස.(උ/පෙළ) විෂයයකට ලකුණු 05 බැගින්.) | 10 | 50% |
| බල ප්‍රදේශය තුළ ජනනය වන කසළ අදාළ ස්ථානයේදී එක්රැස් කිරීමේ ක්‍රමවේදය, අංගනයට ප්‍රවාහනය කිරීමේදී අනුගමනය කළ යුතු කරුණු ඇතුළුව ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම. (ප්‍රශ්න කිහිපයකට වාචිකව පිළිතුරු ලබා ගැනීම.) | 20 | |
| පළාත් පාලන සේවයේ සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය සඳහා (වසරකට ලකුණු 3 බැගින්) | 15 | |
| නිලධාරියා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම. | 05 | |

3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්වීම් බලධරයා.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව සලකා බැලීමෙන් පසුව.

අත්සන : ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්....
තනතුර : පළාත් පාලන කොමසාරිස්...
බස්නාහිර පළාත
දිනය : ..........................
03|20

ලිපි ගොනු අංකය 1/1/4/262 දිනය 2014.02.08

ඇමුණුම 04.

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය, ගිණුම් හා පළාත් මූල්‍ය රීති. | පැය 01 යි. | 100 | 40 % |
| කසළ කළමනාකරණය හා ඒ ආශ්‍රිත අණ පනත් | පැය 01 යි. | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්වීම් බලධාරියා

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය, ගිණුම් හා පළාත් මූල්‍ය රීති. | ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ II,III,IV.V,VII,VIII,XII පරිච්ඡේද සම්බන්ධ මූලික දැනුම. පළාත් පාලන ආයතනවලට අදාළ ගිණුම් තැබීම, පළාත් පාලන විගණනය, බස්නාහිර පළාතේ මූල්‍ය රීති පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| කසළ කළමනාකරණය හා ඒ ආශ්‍රිත අණ පනත් | කසළ වර්ගීකරණය, පරිසරයට අහිතකර නොවන අන්දමින් කසළ බැහැර කිරීම, කසළ ආශ්‍රිත නිෂ්පාදන, කසළ අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ග, කසළ මගින් නිපදවිය හැකි අතුරු නිෂ්පාදන, ප්‍රතිචක්‍රීකරණ ක්‍රමවේදයන් පිළිබඳ නිලධාරියා සතු දැනුම පරීක්ෂා කිරීම කෙරෙන බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |

අත්සන : ..........

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : චන්ද්‍රානි සමරකෝන්

තනතුර : පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත

දිනය : 03/20

85

ඇමුණුම 05

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා පළාත් මූල්‍ය රීති | පැය 01 | 100 | 40 % |
| කසළ කළමනාකරණය හා ඒ ආශ්‍රිත අණ පනත් | පැය 01 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්වීම් බලධාරියා

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා පළාත් මූල්‍ය රීති | ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ II, III,IV, VII, VIII,XII, XIV පරිච්ඡේද පිළිබඳ මූලික දැනුම.<br>ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII, XLVIII පරිච්ඡේද පිළිබඳ මූලික දැනුම.<br>පළාත් පාලන ආයතනවල ගිණුම් තැබීම, පළාත් මූල්‍ය රීති පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න පත්‍රයකින් සමන්විතයි. |
| කසළ කළමනාකරණය හා ඒ ආශ්‍රිත අණ පනත් | කසළ වර්ගීකරණය, පරිසරයට අහිතකර නොවන අන්දමින් කසළ බැහැර කිරීම, කසළ ආශ්‍රිත නිෂ්පාදන, කසළ අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග, කසළ මගින් නිපදවිය හැකි අතුරු නිෂ්පාදන, ප්‍රතිචක්‍රීකරණය කරන ක්‍රමවේදයන් පිළිබඳ නිලධාරියා සතු දැනුම පරීක්ෂා කිරීම,<br>අංගනයේ සේවය,කරන සුළු සේවක ශ්‍රේණිවල චෙක්රෝල් ලකුණු කිරීම, යටත් සේවකයින් අභිප්‍රේරණය සහ ඔවුන්ගේ පරිපාලන කටයුතු පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම, හා මහා නගර සභා ආඥා පනත්, නගර සභා හා ප්‍රාදේශීය සභා පනත් වලින් කසළ අපහරණය පිළිබඳ සැලසී ඇති විධිවිධාන පිළිබඳව සලකා බලන කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න පත්‍රයකි. |

අත්සන : ....................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : චන්ද්‍රානි සමරකෝන්

තනතුර : පළාත් පාලන කොමසාරිස්, බස්නාහිර පළාත

දිනය : 03 | 20

[illegible]

ගොනු අංකය V/1/4/262 [illegible] 2014.02.08

84

ඇමුණුම 06

**සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.**

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා පළාත් මූල්‍ය රීති | පැය 01 විනාඩි 30 | 100 | 40 % |
| කසළ කළමනාකරණය හා ඒ ආශ්‍රිත අණපනත් | පැය 01 විනාඩි 30 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්වීම් බලධරයා.
4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා පළාත් මූල්‍ය රීති | • ආයතන සංග්‍රහයේ I, කාණ්ඩයේ II,III, IV, V,VII, VIII,XII, XIV, XV පරිච්ඡේද පිළිබඳ දැනුම.<br>• ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVII, XLVIII පරිච්ඡේද පිළිබඳ දැනුම.<br>• පළාත් මූල්‍ය රීති පිළිබඳ දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න පත්‍රයකින් සමන්විතයි. |
| කසළ කළමනාකරණය හා ඒ ආශ්‍රිත අණපනත් | කසළ වර්ගීකරණය, පරිසරයට අහිතකර නොවන අන්දමින් කසළ බැහැර කිරීම, කසළ ආශ්‍රිත නිෂ්පාදන, කසළ අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග,කසළ මගින් නිපදවිය හැකි අතුරු නිෂ්පාදන, ප්‍රතිචක්‍රීකරණය කරන ක්‍රමවේදයන් පිළිබඳ නිලධාරියා සතු දැනුම පරීක්ෂා කිරීම,<br>අංගනයේ සේවය කරන සුළු සේවක ශ්‍රේණිවල වෙක්රෝල් ලකුණු කිරීම, යටත් සේවකයින් අභිප්‍රේරණය සහ ඔවුන්ගේ පරිපාලන කටයුතු පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම , මහ නගර සභා ආඥා පනත, නගර සභා හා ප්‍රාදේශීය සභා පනත් වලින් කසළ අපහරණය පිළිබඳ සැලසී ඇති විධිවිධාන පිළිබඳ දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න පත්‍රයකි. |

අත්සන : ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : බස්නාහිර පළාත
03/20

1/4/262 2014.02.08

83

ඇමුණුම....

## ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය

1. නිලධාරියා පිළිබඳ තොරතුරු
   - 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..............................................................
   - 1.2 හැඳුනුම්පත් අංකය : ..............................................................
   - 1.3 සේවා ස්ථානය හා එහි ලිපිනය : ..............................................................
   - 1.4 අයත්වන සේවය හා තනතුර : ..............................................................
   - 1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ..............................................................

2 පත්වීම පිළිබඳ තොරතුරු
   - 2.1 පත්වීම් දිනය : ..............................................................
   - 2.2 පත්වීම් ස්ථිර කළ දිනය : ..............................................................
   - 2.3 සමත්වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය:

| සමත්වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත්වූ දිනය |
|---|---|---|
| | | |

   - 2.4 සමත් වූ භාෂා ප්‍රවීනතා මට්ටම හා සමත් දිනය:

| සමත්වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත්වූ දිනය |
|---|---|---|
| | | |

3 උසස් වීමට අදාළ තොරතුරු
   - 3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : 11/1
   - 3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : ..............................................................
     - 3.2.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත.
     - 3.2.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ..............................................................
     - 3.2.3 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම්කර තිබේද? ඔව්/නැත.
     - 3.2.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව්/නැත.
       උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත.
     - 3.2.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව්/නැත.

4 අයදුම්කරුගේ ප්‍රකාශය.

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් .......................... දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ 11/1 ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

..............................................

දිනය: නිලධරයාගේ අත්සන.

1/1/4/262 2014.07.08

5 <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ අංශ ප්‍රධානියාගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් .............................................. මහතා/මහත්මිය/මෙනෙවිය ......................................................සේවා ශ්‍රේණියේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමකට පත්වෙමි. ඒ අනුව එම සේවකයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

නම : .....................................

අත්සන : .....................................

දිනය : .....................................

නිල මුද්‍රාව : .....................................

6 <u>නාගරික කොමසාරිස්ගේ/ ලේකම්ගේ අනුමැතිය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බැවින්, ඉහත නම් සඳහන් .............................................. මහතා/මහත්මිය/මෙනෙවිය ......................................................සේවා ශ්‍රේණියේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවට සෑහීමකට පත්වෙමි. ඒ අනුව ............................................................................. මහත්මා/ මහත්මිය/ මෙනවිය ...................... දින සිට ................ ශ්‍රේණියට උසස් කිරීම අනුමත කරමි.

නම : .....................................

අත්සන : .....................................

දිනය : .....................................

නිල මුද්‍රාව : .....................................

[illegible] අනුමත කරන ලදී.
[illegible] 1/1/4/262 [illegible] 2014.07.08